# මූලික පිරිවෙන් වර්ෂාවසාන විභාගය - 2013.

## ත්‍රිපිටක ධර්මය

2 වසර | කාලය පැ 2 යි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) i. ත්‍රි විද්‍යා නම් කරන්න.
ii. ''අනේක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං'' ආදී ගාථාව සම්පූර්ණ කරන්න.
iii. සත්සතිය ගත කළ ස්ථාන ලියන්න.
iv. කළගුණ සැලකීම ලොවට හෙළි කළේ කීවන සතියේ දී ද?
v. ගයාවටත් උරුවෙලාවටත් අතර හමු වූ ආජීවකගේ නම කුමක් ද ?
vi. පැවිද්දා විසින් නොසෙවිය යුතු අන්ත 02 ලියන්න.
vii. පස්වග මහණුන් රහත් වූයේ කිනම් සූත්‍රය ඇසීමෙන් ද ?
viii. ගෞතම බුද්ධ ශාසනයේ ප්‍රථම තේවාචික උපාසකයා කවුරුන් ද ?
ix. තුන්බෑ ජටිලයන් නම් කරන්න.
x. ලංකා වාසීන්ට දුරුතු පොහොය වැදගත්වීමට හේතු කවරේ ද ? (3x10 = 30)

(02) I. සුදොවුන් රජුට මහා ධර්මපාල ජාතකය දේශනා කිරීමට හේතුව ලියන්න.
II. උපාලි කරණවැමියා සමග පැවිදි කළ ශාක්‍ය කුමාරවරු නම් කරන්න. (5x2 = 10)

(03) I. අනඳ හිමියන් ලැබූ විශේෂ තනතුරු 02 ක් ලියන්න.
II. මුල් විසි වස් කාලය තුළ සම්බුදු හිමිට උපස්ථාන කළ දෙදෙනෙකුගේ නම් ලියන්න.
(5x2 = 10)

(04) I. නූතන සමාජයේ මංගල ලෙස සිදු කරන මිථ්‍යා විශ්වාස 02 ක් ලියන්න.
II. මංගල සූත්‍රයේ දක්වෙන මංගල කරුණු 02 ක් ලියන්න. (5x2 = 10)

(05) I. නහිවේරේන වේරාණි........... යන ගාථාව සම්පූර්ණ කරන්න.
II. නහිවේරේන වේරාණි........... යන ගාථාවෙහි තේරුම ලියන්න. (5x2 = 10)

(06) I. තිලමුට්ඨි ජාතකයෙන් ගත හැකි ආදර්ශය ලියන්න.
II. දාගැබ් මහබෝ ආදියෙහි පිරිය යුතු වත් ලියා දක්වන්න. (5x2 = 10)

(07) I. අශෝක චණ්ඩාශෝක වීමටත් පසුව ධර්මාශෝක වීමටත් හේතු කවරේද?
II. අශෝක රජු විසින් පත් කරන ලද ධර්ම මහා අමාත්‍ය තුමාගේ කාර්ය භාරය ලියන්න.
(5x2 = 10)

(08) I. භික්ෂූන් හැට නමක් මාතිකා ගමෙහි වස් වසා කතිකා කරගත්තේ කුමක් කිරීමටද?
II. මාතික මාතා භාවනා කිරීමෙන් ලබාගත් ප්‍රතිඵල මොනවාද? (5x2 = 10)